සැ. යු.– 2007.09.07 දින පළවූ අංක 1,514 දරන *ගැසට් පත්‍රයේ* II සහ IV(අ) කොටස් පළනොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,515— 2007 සැප්තැම්බර් මස 14 වැනි සිකුරාදා — 2007.09.14**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ජෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)



| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු … … … … | – | විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … | 1019 |



**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 සැප්තැම්බර් මස 21 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 සැප්තැම්බර් මස 07 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධි විධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම් කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ටද, ඔහුගේ සහාකාරයින්ටද, අනිකුත් විභාගාපේක්ෂකයින්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාගශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම්ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු වනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිතික උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවිම හෙවත් කොපි කිරීම හොර උත්තර ලිවීමටද යත්න දැරීම තහනම්ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම් කරුවෙකුට උදව්දීමෙන්ද, වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබාගැනීමෙන්ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් වි භාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයින් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය :

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කළින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කට කළින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට වි භාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්ට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රේදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිවද පිරිසිදුවද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්නද, තෝරා ගත යුතු අන් ප්‍රශ්නද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන්වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සළකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවි ය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

## රත්මලාන ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානයට ආධුනිකයින් ඇතුළත් කර ගැනීම - 2007 වර්ෂය

රත්මලාන ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානයට 2007 වර්ෂය සඳහා ආධුනික/ආධුනිකාවන් ඇතුළත් කර ගැනීම පිණිස මෙහි 2 වන ඡේදයේ සඳහන් අවම සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *අවම සුදුසුකම්* :

(*අ*) *වයස*.- 2007.05.31 දිනට අවුරුදු 16-25 විය යුතුය.

(*ආ*) *අධ්‍යාපන සුදුසුකම්* .- සිංහල/දෙමළ භාෂාව, ගණිතය හා විද්‍යාව ඇතුළු විෂයයන් 06ක් සහිතව අ.පො.ස. (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම. 2006.12.31 දිනට කලින් අධ්‍යාපන සුදුසුකම් ලබා සිටීමත්, පළමු වාරයේදී විෂයයන් 05කින් සමත්වී සිටීමත් අවශ්‍යවේ.

03. *පුහුණු පාඨමාලා* .- ආධුනික පුහුණුවට තෝරා ගනු ලබන ආධුනිකයන්ට පහත සඳහන් වෘත්තීන් හා එම වෘත්තීන්ට අදාළ කාලසීමාවට යටත්ව පාඨමාලාව හැදෑරීමට ඉඩ සලසනු ලැබේ. පාඨමාලාව පවත්වනු ලබන්නේ සිංහල මාධ්‍යයෙන් පමණි. පහත සඳහන් පාඨමාලා සඳහා 18 දෙනා බැගින් තෝරා ගනු ලැබේ.

| | | |
|---|---|---|
| (i) | ඩීසල් එන්ජින් යාන්ත්‍රික ශිල්පී | අවුරුදු 02 1/2 |
| (ii) | පෑස්සුම්කරු | අවුරුදු 03 |
| (iii) | විදුලි ශිල්පී (බල) | අවුරුදු 03 1/2 |
| (iv) | යාන්ත්‍රකරු (සාමාන්‍ය) | අවුරුදු 03 1/2 |
| (v) | මෝටර් රථ කාර්මික ශිල්පී | අවුරුදු 04 |

04. *අයදුම්පත්* .- අයදුම්කරුවන් විසින් මේ සමග ඇති ආකෘති පත්‍රය අනුව මි. මී. 297x 210 (ඒ4) ප්‍රමාණයේ සුදු කඩදාසියක පිළියෙල කරගත් අයදුම්පත් වල සම්පූර්ණ විස්තර නිවැරදිව සඳහන් කළ යුතුය. අවශ්‍ය සම්පූර්ණ තොරතුරු සඳහන් නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. *පාඨමාලා සඳහා තෝරා ගැනීම* :–

(i) ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ මගින් සිදු කරන අතර, අවශ්‍ය අවම සුදුසුකම් ඇති හා 7 ඡේදයේ සඳහන් විභාග ගාස්තු ගෙවා ඇති අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

(ii) ලිඛිත පරීක්ෂණය ගණිතය, මූලික කාර්මික දැනුම හා සාමාන්‍ය දැනීම පදනම් කරගෙන පැවැත්වේ. ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් ඒ ඒ පාඨමාලා පදනම යටතේ ප්‍රායෝගික/සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

(iii) ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණවල දී වැඩිම මුළු ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් ඒ ඒ පාඨමාලාවන් සඳහා තෝරාගනු ලැබේ.

06. *විභාග මාධ්‍යය*.- විභාග මාධ්‍යයන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි වේ.

07. *විභාග ගාස්තු* .-මෙම විභාගය සඳහා ආපසු නොගෙවනු ලබන රු. 250ක ගාස්තුවක් අය කෙරේ. එම ගාස්තුව මරදාන තැපැල් කාර්යාලයෙන් ලබා ගැනීමට හැකිවන පරිදි දුම්රිය සාමාන්‍යාධිකාරී නමට ලියූ මුදල් ඇණවුමකින් හෝ නැතහොත් ඕනෑම දුම්රිය ස්ථානයකට හෝ මරදාන ප්‍රධාන දුම්රිය ගණකාධිකාරී කාර්යාලයට හෝ ගෙවිය හැක. එසේ ලබාගත් මුදල් ඇණවුම/කුවිතාන්සිය අයදුම්කරුවන් විසින් එවනු ලබන ඉල්ලුම්පත්‍රයට අමුණා එවිය යුතුය. මුදල් ඇණවුම හෝ කුවිතාන්සියක් අමුණා නොඑවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඇතුළත් වීමේ විභාගයට පෙනී නොසිටීම නිසා හෝ වෙනත් කිසිම හේතුවක් නිසා හෝ විභාග ගාස්තු ආපසු නොගෙවන බව සැළකිය යුතුය.

08. *විභාග මධ්‍යස්ථාන* .-සියළුම අවශ්‍යතා සම්පූර්ණ කරන අයදුම්කරුවන් සඳහා ලිඛිත පරීක්ෂණයක් කොළඹ මධ්‍යස්ථානයක දී පමණක් පැවැත්වේ.

09. *ගිවිසුම් අත්සන් කිරීම* .- ආයතනයේ පුහුණුවට තෝරාගනු ලබන සියළුම අයදුම්කරුවන් වෘත්තියට අදාළ කාලසීමාවන් තුළ පුහුණුව සාර්ථකව හදාරන බවට ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමග ගිවිසුමකට අත්සන් තැබිය යුතුය.

10. පුහුණුව ලබන කාලය තුළ ආධුනිකයින්/ආධුනිකාවන් සඳහා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය මගින් මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

11. පුහුණුවෙන් පසු ආධුනිකයන්ට රැකියා ලබාදීමට දෙපාර්තමේන්තුව බැඳී නැත.

12. පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත් පෝර්මය අනුව අයදුම්පත් පිළියෙල කර, අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානය, කල්දෙමුල්ල පාර, රත්මලාන වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ඉල්ලුම්පත්‍රය බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ ශ්‍රී. ලං. ජ. දු. කා. අ. ම. /2007 යනුවෙන් සඳහන් කළ යුතුය.

13. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය.– අයදුම්පත් 2007.10.15 වැනි දින තෙක් භාරගනු ලබන අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ටී. ලලිතසිරි ගුණරුවන්,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

2007 අගෝස්තු මස 23 වැනි දින,
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
කොළඹ 10.

### ආදර්ශ අයදුම්පත්‍රය

### ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානයට ආධුනිකයින් බඳවා ගැනීම - 2007

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.

1. නම සම්පූර්ණයෙන් (වාසගම සමග) සිංහලෙන් හා ඉංග්‍රීසියෙන් ලියන්න. :——————.
2. ලිපිනය (සිංහලෙන්) :——————.
   (ඉංග්‍රීසියෙන්) :——————.
3. දිස්ත්‍රික්කය :——————.
4. උපන් දිනය :——————.
5. ස්ත්‍රී/පුරුෂ භාවය :——————.
6. අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස. (සා.පෙළ)

*පළමුවර* :

වර්ෂය:——————. විභාග අංකය :——————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. .......................... | ................. |
| 2. .......................... | ................. |
| 3. .......................... | ................. |
| 4 .......................... | ................. |
| 5. .......................... | ................. |
| 6. .......................... | ................. |
| 7. .......................... | ................. |
| 8. .......................... | ................. |
| 9. .......................... | ................. |
| 10. .......................... | ................. |

*දෙවන වර* :
වර්ෂය :——————. විභාග අංකය :——————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. .......................... | ................. |
| 2. .......................... | ................. |
| 3. .......................... | ................. |
| 4 .......................... | ................. |
| 5. .......................... | ................. |
| 6. .......................... | ................. |
| 7. .......................... | ................. |
| 8. .......................... | ................. |
| 9. .......................... | ................. |
| 10. .......................... | ................. |

7. අයදුම්කරු විභාගයට පෙනී සිටීමට කැමති මාධ්‍යය :——————.

8. දැන්වීම අනුව තමා කැමති වෘත්තීන් දෙකක් අනු පිළිවෙලින් සඳහන් කරන්න :

1. ——————.
2. ——————.

9. ..........................තැපැල් කාර්යාලයට/දුම්රිය ස්ථානයට රු. 250ක් ගෙවා ලබා ගන්නා ලද අංක.............. දරන මුදල් ඇණවුම/රිසිට්පත මෙයට අමුණා ඇත.

10. ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මම මෙයින් සහතික කරමි. මෙහි සහතික කරන ලද විස්තරවලින් යමක් අසත්‍ය බව මා තෝරා ගැනීමට කලින් පෙනී ගියහොත් එයින් මා නුසුදුස්සෙකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු පෙනී ගියහොත් පුහුණුවෙන් ඉවත් කර දමනු ලැබීමටත් හැකිවන බව මම දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

09-419

## ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2007

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීම සඳහා විවෘත තරග විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2007 දෙසැම්බර් මාසයේ දී කොළඹ දී පමණක් පවත්වනු ලැබේ. විභාගය පවත්වන දිනය යථා කාලයේ දී පුවත්පත් මගින් දැනුම් දෙනු ඇත. මෙම විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

මෙහි පහත සඳහන් සුදුසුකම් සතුව ඇති ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම මෙම තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. *යෝග්‍යතාව* :

(i) සෑම අපේක්ෂකයෙකුම ඔහු/ඇය -
(*අ*) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු බවත්,
(*ආ*) විශිෂ්ට චරිතයකින් යුත් අයෙකු බවත්,
(*ඇ*) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු සහ 33 ට නොවැඩි බවත් සතුටුදායක සාක්ෂිවලින් ඔප්පු කළ යුතුය.

(ii) *අධ්‍යාපන සුදුසුකම්* :- අපේක්ෂකයෙකුට පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් තිබිය යුතුය.
(*අ*) පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් මැනුම් විද්‍යාව පිළිබඳ උපාධියක් හෝ භෞතික විද්‍යාව පිළිබඳ (ගණිතය ද ඇතුළත්ව) දෙවන පෙළ හෝ පළමු පෙළ ගෞරව සාමාර්ථයක් සහිත විද්‍යාවේදී උපාධියක්.

*සටහන* :- උපාධි විභාගයක ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින කිසිම අයෙකුට මෙම විභාගයට පෙනී සිටීමට නොහැක. කෙසේ වුවද පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සමත් වූ අයෙකුට ඔහු/ඇය එම උපාධි විභාගය සමත් වූ බවට එම විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරිගෙන් ලබා ගත් නිල ලිපියක් ඉදිරිපත් කළ අවස්ථාවක දී මෙම විභාගයට පෙනී සිටීමට අවසර දිය හැක.

03. *සේවා කොන්දේසි* :

(i) *වැටුප්* :- මෙම තනතුරට අයත් ඒකාබද්ධ මාසික වැටුප් පරිමාණය පහත දැක්වේ.
රා.ප.ච.ලේ. අංක: 06/2006-එම්.එන්. 5
රු. 15,785-10X 290 - 15X325 - 11 X400- රු. 27,960

(ii) තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

(iii) *සේවය ස්ථිර කිරීම*.– ආධුනික මිනින්දෝරු තනතුර සඳහා බඳවා ගනු ලබන මැනුම් විද්‍යා උපාධිධාරීන් දෙපාර්තමේන්තු කටයුතු පිළිබඳ පුහුණුව සාර්ථකව නිමකර පුහුණු කාලය සමග වසර 4ක සතුටුදායක ලෙස සේවය සම්පූර්ණ කිරීමෙන් පසුව මිනින්දෝරු සේවයේ II/II වන පන්තියට පත්කර සේවයේ ස්ථිර කරනු ලැබේ.

ආධුනික මිනින්දෝරු තනතුර සඳහා බඳවා ගනු ලබන භෞතික විද්‍යා උපාධිධාරීන් මැනුම් විද්‍යා උපාධිය සාර්ථකව නිමකර පුහුණු කාලය සමග වසර 6 ක් සතුටුදායක ලෙස සේවය සම්පූර්ණ කිරීමෙන් පසුව මිනින්දෝරු සේවයේ II/II පන්තියට පත් කර සේවයේ ස්ථිර කරනු ලැබේ.

(iv) පත්වීම් ලබන්නන් විසින් තමන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව සුදුසු ද නැද්ද පරීක්ෂා කිරීම පිණිස රජයේ

වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

(v) මෙම *ගැසට් පත්‍රයේ* I වැනි කොටස (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ පළකොට ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට කෙරෙන පත් කිරීම්වලට අදාළ පොදු කොන්දේසිවලට ද අවධානය යොමු කෙරේ.

04. *විභාග පරිපාටිය* :- බඳවා ගැනීමේ විභාගය ප්‍රශ්න පත්‍ර 03 කින් සමන්විත වේ. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| 01. | අවබෝධය | ලකුණු 50 යි | පැය 02 යි |
| 02. | බුද්ධි පරීක්ෂණය | ලකුණු 150 යි | පැය 01 යි විනාඩි15 යි |
| 03. | පොදු ප්‍රශ්න පත්‍රය | ලකුණු 150යි | පැය 03 යි |
| | *එකතුව* | *ලකුණු 350* | |

*අවබෝධය* :- පැය 02 ක කාල සීමාවකට සීමාවන මෙම ප්‍රශ්න පත්‍ර මගින් කෙටි පාඨ ගණනාවක් අපේක්ෂකයින් වෙත දෙනු ලැබේ. ඇතැම් පාඨ දෙනු ලබන්නේ එක් වාක්‍යයකින් ප්‍රකාශ කිරීම පිණිසයි. යටින් ඉරි ඇඳි පදවලට විවරණ සැපයීමේ ප්‍රශ්න ද දෙනු ලැබේ. තවත් ඇතැම් පාඨ සම්බන්ධයෙන් අපේක්ෂකයින් වෙත විකල්ප ප්‍රකාශ ගණනාවක් ඉදිරිපත් කරන අතර, ඉන් එකක් මෙම පාඨයේ අන්තර්ගත කරුණුවලට වඩාත්ම හොඳින් ගැලපෙයි. අපේක්ෂකයින් මෙයින් වඩාත් උචිත ප්‍රකාශය තෝරාගත යුතුය. තවත් ඇතැම් පාඨ සම්බන්ධයෙන් අපේක්ෂකයා වෙත ප්‍රශ්න කිහිපයක් ඉදිරිපත් කරනු ඇත. ඒවාට නිවැරදි පිළිතුරු දීම අපේක්ෂා කෙරේ. මේ ප්‍රශ්න පිළියෙල කරන්නේ අපේක්ෂකයා එම පාඨයන්ගේ අර්ථය වටහා ගන්නා ආකාරය පරීක්ෂා කිරීම සඳහාය. මෙයට අමතරව සාරාංශ ලිවීම සඳහා දිග පාඨයක් දෙනු ලැබේ.

*බුද්ධි පරීක්ෂණය*.- පැය 01 යි, විනාඩි 15 කට සීමාවන මෙය සකස් කර ඇත්තේ අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූල තත්ත්වයටත්, ඔහුගේ සිතෙහි විශ්ලේෂණ තත්ත්වයන් ඔහුගේ තීරණ ගැනීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහාය. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ක්‍රමයට ගැලපෙන ප්‍රශ්නවලින් යුක්ත වනු ඇත.

*පොදු ප්‍රශ්න පත්‍රය*-මෙය අපේක්ෂකයා වාසය කරන හා සේවය කරන පරිසරය ඇතුළුව ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සමාජමය, සංස්කෘතික හා ආර්ථික පරිසරය ද, ජාතිකව හා අන්තර්ජාතිකව වැදගත් වන නූතන කරුණු මෙන්ම විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය ද සම්බන්ධයෙන් ඇති ඔහුගේ දැනීම පරීක්ෂා කිරීම සඳහා සකස් වූ පොදු ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න කිහිපයකින් තමන් කැමති ප්‍රශ්න තෝරා ගැනීමට අවසර ඇත. මෙය පැය තුනක ප්‍රශ්න පත්‍රයකි.

*සටහන* :-

(I) මෙම විභාගය සිංහල, ඉංග්‍රීසි හා දෙමළ මාධ්‍යවලින් පවත්වනු ලැබේ. විභාගයට පෙනී සිටීමට මෙම නිවේදනයේ 02(II) ඡේදයට අනුව විභාගයට තමන් පෙනී සිටි භාෂා මාධ්‍යයෙන්ම (එනම් සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයෙන් අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් පෙනී සිටිය යුතුය. කෙසේ වුවද සුදුසුකම් ලැබීමේ විභාගයට දෙමළ මාධ්‍යයෙන් හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පෙනී සිට සමත් වූ අපේක්ෂකයෙකුට/අපේක්ෂිකාවකට *නැතහොත්* දෙමළ මාධ්‍යයෙන් හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලද අපේක්ෂකයකුට/ අපේක්ෂිකාවකට තමා කැමති නම් මෙම විභාගයේ දී සිංහල භාෂා මාධ්‍යයෙන් පිළිතුරු සැපයිය හැකිවේ. විභාගයට ඉල්ලුම් කරන ලද මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලබන බව ද සලකන්න.

(II) නොපැහැදිලි අත් අකුරු සහ වැරදි අක්ෂර වින්‍යාසයටද ලකුණු අඩු කරනු ලැබේ. නොපැහැදිලි අත්අකුරු ඇති අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් විභාගයට නුසුදුස්සන් කරනු ලැබීමට ද ඉඩ ඇත.

(III) විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කර ඇති අපේක්ෂකයින්ට/ අපේක්ෂිකාවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර එවනු ලැබේ. එහෙත් විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍රයක් ලැබීම විභාගය සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබීමක් ලෙස නොසැලකිය යුතුය.

(IV) *ඇගයීමේ ක්‍රමය* :- විභාග නිවේදනයේ ශීර්ෂ අංක 05 හි සඳහන් කොන්දේසිවලට අනුකූලව තරග විභාගයේ දී එක් එක් ප්‍රශ්න පත්‍රයට ලබා ගන්නා ලකුණුවල එකතුව අනුව ලකුණු ලබා ගන්නා වැඩිම ප්‍රමාණයේ සිට පහළට එමින් එක් එක් කාණ්ඩයේ පවත්නා පුරප්පාඩු අනුව අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී අපේක්ෂකයින්ට ලකුණු නොලැබෙන අතර, විභාගයේ දී ලබා ගත් ලකුණු පමණක් සැලකිල්ලට ගනු ලැබේ.

05. *තෝරා ගැනීමේ පදනම* :- ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීමේ දී බඳවා ගනු ලබන සංඛ්‍යාවෙන් 90% ක් උක්ත සුදුසුකම් සහිත උපාධිධාරීන්ගෙන් විවෘත තරග විභාගයක් මගින් පුරවනු ඇත. ඉන් 10% ක් භෞතික විද්‍යාව පිළිබඳව (ගණිතය ද ඇතුළත්ව) ගෞරව උපාධිධාරින්ගෙන් හා ඉතිරිය මැනුම් විද්‍යාවේදී උපාධියක් ඇති අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කරනු ලැබේ. ප්‍රමාණවත් සංඛ්‍යාවක් මැනුම් විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිධාරීන් ඉල්ලුම් කර නොමැති විට එම පුරප්පාඩු භෞතික විද්‍යාව පිළිබඳව (ගණිතය ද ඇතුළත්ව) විද්‍යාවේදී උපාධිධාරීන් මගින් සම්පූර්ණ කරනු ලැබේ. එසේම ප්‍රමාණවත් සංඛ්‍යාවක් භෞතික විද්‍යාව පිළිබඳව (ගණිතය ද ඇතුළත්ව) විද්‍යාවේදී උපාධිධාරීන් ඉල්ලුම් කර නොමැති විට එම පුරප්පාඩු මැනුම් විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිධාරීන් මගින් සම්පූර්ණ කරනු ලැබේ.

06. සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියළුම සුදුසුකම් විභාගය සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්යය වේ.

07. *ඉල්ලුම් කිරීමේ පිළිවෙල* :

(I) *ආදර්ශ අයදුම් පත* :- මෙම නිවේදනයේ අවසානයේ පළ කර ඇත. අයදුම්කරුවන් විසින් අදාළ ආදර්ශ අයදුම්පත තමා විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙන්ම සකස් කළ යුතු අතර, ඊට අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව සම්පූර්ණ කළ යුතුය. ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද සඳහන් කළ යුතුය. අයදුම්පතේ සෑම වගන්තියක්ම උපදෙස් ලබාදී ඇති පරිදිම අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතු අතර, තමන් වෙනුවෙන් අදාළ නොවන වගන්ති වෙතොත් ඒවා "අදාළ නොවේ" යනුවෙන් සටහන් කළ යුතුය. අයදුම්පතේ හිස් තීරු තැබීමෙන් එය ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇති බව තරයේ ම සිහිතබා ගත යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තමා යවන අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම අයදුම්කරුවනට ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුවහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බව ද සලකන්න. (ආදර්ශ අයදුම්පතේ 1.0 සිට 5.0 වන තෙක් ශීර්ෂ 01 පිටුවට ද, 6.0 සිට 9.0 තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද වන සේ ඒ 4 ප්‍රමාණයේ කඩදාසිවල සකස් කර ගන්න)'

(II) අයදුම්පත් 2007 ඔක්තෝබර් මස 05 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් ලියාපදිංචි තැපැලෙන් "විභාග කොමසාරිස් ජනරාල් , ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, සංවිධාන සහ විදේශ විභාග ශාඛාව,පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට එවිය යුතුය. එම දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය බහා එවනු ලබන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම පැහැදිලිව සඳහන් කළ යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(III) විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ අංක 4000-20-03-20-13 යටතේ ඕනෑම දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට විභාග ගාස්තු වශයෙන් රු. 300 ක මුදලක් ගෙවා ලබා ගත් ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය. මුදල් ගෙවූ රිසිට් පතේ ඡායාපිටපතක් අයදුම්කරුවන් විසින් තමන් ළඟ තබා ගැනීම ඉතාම යෝග්‍ය වේ. මෙම විභාග ගාස්තු කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

(IV) ආණ්ඩුවේ දෙපාර්තමේන්තු/මණ්ඩල/ සංස්ථා ආදියෙහි දැනට සේවයෙහි යෙදී සිටින අපේක්ෂකයින් තමන්ගේ අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ හෝ ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. 2007 ඔක්තෝබර් මස 05 වැනි දින හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල් වෙත ලැබෙන පරිදි යවන ලෙස ඉල්ලීමක් ද සමග ස්වකීය අයදුම්පත් තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් වෙත කල් ඇතිව ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. සර්වේයර් ජනරාල්ගේ හෝ එම දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියෙකුගේ පෞද්ගලික නමට අයදුම්පත් නොඑවිය යුතුය. දෙපාර්තමේන්තු මගින් ඉදිරිපත් කරන අයදුම්පත් වුව ද නියමිත දිනට පසුව ලැබුණහොත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගේ අයදුම්පත්වල අත්සන සහතික කිරීම සඳහා දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන්ගේ අත්සන හා නිලමුද්‍රාව තබා නොමැති නම් එම අයදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත.

(V) *සහතික කිරීම* .- දැනට රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවකුගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු විසිනි. අනිකුත් අයදුම්කරුවන්ගේ අත්සන්, ඒවා සහතික කිරීමට බලයලත් කෙනෙකු විසින් සහතික කළ යුතුය. එනම් සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥයෙකු, නොතාරිස් කෙනෙකු, රජයේ හෝ අධ්‍යක්ෂ පාලිත පාසලක විදුහල්පතිවරයෙකු, නාවික, ගුවන් හෝ යුධ හමුදාවක කොමිෂන් ලත් නිලධාරියෙකු, වැටුප් පරිමාණයේ ආරම්භක මාසික ඒකාබද්ධ වැටුප රු. 19,755 ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන පූජ්‍ය කෙනෙකු යන අයගෙන් කෙනෙක් විසිනි.

08. *විභාගයට ඇතුළත් කර ගැනීම* .- විභාග කොමසාරිස් ජනරාල් විසින් භාර ගනු ලැබූ අයදුම්පත් වෙනුවෙන් ඒ ඒ අපේක්ෂකයින් වෙත ප්‍රවේශ පත්‍ර යවනු ලැබේ. විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් විසින් තමන්ගේ අත්සන් සහතික කරවා ගත් එම ප්‍රවේශ පත්‍ර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එබඳු ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

අයදුම්කරුවන් තමන්ට නියම කර තිබෙන විභාග ශාලාවෙහිම විභාගයට පෙනී සිටිය යුතුය. තමාට නියම කර ඇති විභාග ශාලාව හැර වෙනත් විභාග ශාලාවකට පැමිණෙන කිසිම අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයෙකු විසින්ම තමන් විභාගයට පෙනී සිටින දිනයෙහිම ස්වකීය ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත භාර දිය යුතුය. මෙම *ගැසට් පත්‍රයේ* පළමුවැනි කොටස (IIඅ) ඡේදයෙහි විභාග අපේක්ෂකයින් සඳහා සකස් වූ ව්‍යවස්ථා පළකොට ඇත. විභාග අපේක්ෂකයින් මෙම ව්‍යවස්ථා පිළිපැදීමට බැඳී සිටිති. කිසියම් අපේක්ෂකයෙකුට යටත් පිරිසෙයින් විභාගය පැවැත්වෙන දිනට සත් දිනකට කලින්වත් තම ප්‍රවේශ පත්‍රය නොලැබුනහොත්, ඔහු පහත දැක්වෙන තොරතුරුත් සමග 'බත්තරමුල්ල, පැලවත්ත, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, විභාග කොමසාරිස් ජනරාල්' යන ලිපිනයට පහත දැක්වෙන විස්තර සමග ඒ බව අප්‍රමාදව දන්වා එවිය යුතුය.

1. විභාගයේ නම,
2. අපේක්ෂකයාගේ සම්පූර්ණ නම,
3. සම්පූර්ණ ලිපිනය,
4. අයදුම්පත ලියාපදිංචි කළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි අංකය හා අයදුම්පත තැපැල් කළ දිනය,
5. විභාග ගාස්තු ගෙවූ රිසිට්පතේ සඳහන් අංකය, දිනය, දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

09. *හැඳුනුම්පත්* .- අපේක්ෂකයින් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරින් කුමක් වුවත් භාරගනු ලැබේ.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය.;
(ආ) මෙම විභාග දිනට අවුරුදු 03කට වැඩි නොවන කාලයක් ඇතුළත නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රයක් (පාස්පෝට් බලපත්‍රයක්).

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

10. *සුදුසුකම් පිළිබඳ ලියවිලි* :

(i) අයදුම්පත සමග මුදල් තැන්පත් කළ කුවිතාන්සිය හැර වෙනත් කිසිදු ලිපිලේඛනයක් නොඑවිය යුතුය. එහෙත් නියම කොට ඇති පරිදි අවශ්‍ය සියළුම විස්තර අයදුම්පතෙහි සඳහන් කළ යුතුය. මෙසේ අවශ්‍ය වන කරුණුවලින් සම්පූර්ණ නොවන අයදුම්පතක් වේනොත් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) සම්මුඛ පරීක්ෂණයකට කැඳවීමට සුදුසුකම් ලබන අපේක්ෂකයින් ලියකියවිලිවලින් සාක්ෂි ඉදිරිපත් කොට ස්වකීය යෝග්‍යතාවය ඔප්පු කළ යුතුය.

(iii) පහත දැක්වෙන ලියකියවිලිවල මුල් පිටපත් අවශ්‍ය වේ:

(අ) යහපත් චරිතය පිළිබඳ වගකිව යුතු පුද්ගලයෙකු විසින් අත්සන් කරන ලද සහතිකයක්.

*සටහන* .- එම සහතිකය සාමදාන විනිශ්චයකාරවරයෙක්, නීතිඥවරයෙක්, පදිංචි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා හෝ වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවර රු. 2,37,060 හෝ ඉන් වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙක් හෝ සාමාන්‍යයෙන් ප්‍රසිද්ධියක් දරන කෙළින්ම දන්වා තොරතුරු ලබා ගත හැකි තැනැත්තෙක් යන මොවුන්ගෙන් කවරකුගෙන් වුවද ලබාගත හැකිවේ. සහතිකය දෙන තැනැත්තාගේ පදවි නාමය, නම සහ ලිපිනය ද එහි පැහැදිලි ලෙස සඳහන්ව තිබිය යුතුය.

රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් උසුලන අපේක්ෂකයින් විසින් යහපත් චරිතය පිළිබඳ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

(ආ) අපේක්ෂකයාගේ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනෙහි සහතික කළ පිටපතක් හෝ (උප්පැන්න ලියාපදිංචි නොකළ අපේක්ෂකයින් සම්බන්ධයෙන් වූ විට) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකයක්.

*සටහන*.-

(i) පාඨශාලාවල භාවිතය සඳහා හෝ අධ්‍යාපනික කටයුතු උදෙසා නිකුත් කරන ලද විශේෂ උප්පැන්න සහතික හෝ උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහනෙන් උපුටා ගන්නා ලද සහතික කළ උධෘත හෝ භාර ගනු නොලැබේ.

(ii) උප්පැන්න සහතිකය වෙනුවට දිවුරුම් පෙත්සම් හෝ බෞතීස්ම සහතික භාර ගනු නොලැබේ. උප්පැන්න සහතිකයෙහි දැක්වෙන නම/නම් හා අපේක්ෂකයාගේ සාමාන්‍යයෙන් භාවිත කරන එසේම ඔහු විභාගයේ දී පෙනී සිටින නම/නම් හා අතර වෙනසක් වේ නම් උචිත පරිදි උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (110 වැනි පරිච්ඡේදය) අංක 27 හෝ 28 දරන නියමයන් අනුව ස්වකීය උප්පැන්නයේ දැක්වෙන නම/නම් වෙනස් කරවා ගැනීමට වහාම කටයුතු කළ යුතුය.

(iii) ලංකාවේ පුරවැසියෙකු වශයෙන් ලියාපදිංචි වීමේ සහතිකයක් හෝ පරම්පරාවෙන් හිමි වූ පුරවැසි බවක් ඇති බැව් රජය මගින් පිළිගත් බව දැක්වෙන ලිපියක් (උචිත පරිදි).

(iv) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතිකපත් හෝ එසේ සහතිකපත් නිකුත් කොට නැත්නම් ඊට අදාළ වූ වෙනත් රාජකාරි ලියවිල්ලක් එනම්,

අපේක්ෂකයාගේ උපාධි විභාගය සමත් බවට විශ්ව විද්‍යාලයක ලේඛකාධිකාරි විසින් නිකුත් කරන ලද නිල ලියවිල්ලක් හා විභාග දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) ජාතික අධ්‍යාපන සහතික පත්‍ර විභාගය ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් සහිතව සමත් වූ බවට නිකුත් කරන ලද ප්‍රතිඵල ලේඛනය.

(v) ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කරන ලද අවස්ථාවේදී අවශ්‍ය සියලුම ලිය කියවිලි සූදානම් කොට තබා ගන්නා ලෙස අපේක්ෂකයින්ට අවවාද කරනු ලැබේ. ඉල්ලා සිටින විටෙක අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ ඒවා ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අපේක්ෂකයකු වෙතොත් ඔහු මෙම තනතුරට පත් කිරීමට නුසුදුස්සෙකු කරනු ලැබේ.

11. *සාවද්‍ය තොරතුරු සැපයීම* .-මෙම විභාගයේ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකුට ඊට පෙනී සිටීමට සුදුසුකම් නැති බව පෙනී ගියහොත් විභාගයට පෙරාතුව හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව හෝ කවර අවස්ථාවක දී වුවද, ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය. අපේක්ෂකයෙකු විසින් දැන දැනම සාවද්‍ය තොරතුරක් සපයා ඇති බවක් හෝ කිසියම් වැදගත් කරුණක් දැන දැනම වසන් කළ බවක් හෝ පෙනී ගියහොත් හෝ ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටීමට නුසුදුස්සකුව සිටි බව ඔහුගේ/ඇයගේ සේවා කාලය තුළ කිසියම් අවස්ථාවක දී ඔප්පු වුවහොත් හෝ එයම ඔහු/ඇය වහාම සේවයෙන් පහ කිරීමට හේතු වනු ඇත. මෙම නිවේදනයේ සඳහන් අවශ්‍යතා නියමිත අයුරින් සපයා නොමැති අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12. මෙම රෙගුලාසිවලින් විස්තර නොකරන ලද අදාළ වූ වෙනයම් කරුණක් වේ නම් එය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අභිමතය පරිදි තීරණය කරනු ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ලේකම්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය.

2007 අගෝස්තු මස 29 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
80/5, ගොවිජන මන්දිරය,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### ආදර්ශ අයදුම්පත්‍රය

### *ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව*

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2007

**Open Competitive Examination for Recruitment to the Posts of Apprentice Surveyors in the Survey Department of Sri Lanka - 2007**

[ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
(සිංහල -02, දෙමළ - 03, ඉංග්‍රීසි - 04) [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.0 නම :

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :——————————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් උදා - SILVA, A.B.)

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :——————————.

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :——————————.

2.0 ලිපිනය :

2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :——————————.

2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :——————————.

2.3 රාජකාරි ලිපිනය :——————————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්, අදාළ නම් පමණි)

2.4 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :——————————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ජනවර්ගය :
සිංහල - 1, දෙමළ - 2, ඉන්දියානු දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 ස්ත්‍රී පුරුෂ භාවය
ස්ත්‍රී - 1, පුරුෂ - 0 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.3 උපන් දිනය:-

වර්ෂය: [ | | | ] මාසය: [ | ] දිනය : [ | ]

3.4 2007.10.05 දිනට වයස :

අවුරුදු: [ | ] මාස: [ | ] දින: [ | ]

3.5 ජාතික හැඳුනුම්පත් අංකය: [ | | | | | | | | | ]

3.6 නිකුත් කළ දිනය :——————————.

4.0 (i) උපාධිය ලද දිනය :——————————.
(ii) විශ්වවිද්‍යාලය/ආයතනය:——————————.
(iii) ලියාපදිංචි වූ අංකය හා දිනය:——————————.
(iv) බාහිර/අභ්‍යන්තර:——————————.
(v) උපාධිය:——————————.
(vi) විෂයයන්:——————————.

(vii) පන්තිය:——————————.
(viii) ඉහළ/පහළ:——————————.
(ix) විභාග අංකය:——————————.
(x) විභාගයට පෙනී සිටිය භාෂා මාධ්‍යය:——————————.

5.0 ලබා ඇති උපාධිය:
භෞතික විද්‍යාව (ගණිතය ද ඇතුළුව) විද්‍යාවේදී ගෞරව
උපාධිය - 1
මැනුම් විද්‍යාවේදී උපාධිය - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

6.0 මුදල් කුවිතාන්සිය මනා ලෙස අලවන්න. කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න.

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. |
|---|

7.0 *අයදුම්කරුගේ සහතිකය* :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය බවත්, ..........................................දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඇතුළත් වීමේ ගාස්තු ගෙවන ලද අංක ..............................හා ..............................වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාග නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

8.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (*ගැසට්* නිවේදනයේ 07 වැනි ඡේදයේ පරිදි විය යුතුය).

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ..........................(සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත් .....................දින ඔහුගේ /ඇයගේ අත්සන දින මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

——————————.
(අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන).

දිනය :——————————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :——————————.
තනතුර :——————————.
ලිපිනය :——————————.

9.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (අදාළ නම් පමණි):

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ................මයා/මිය/මෙනවිය දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ/මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු බවත් ඔහු/ඇය නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

——————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

තනතුර:——————————.
දිනය:——————————.

09-595

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.